ලේඛ අංක:- 10/2006

මගේ අංකය:- බප/සසේකො/ලේ/නිර්.
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක: 50, කිතුල්වත්ත පාර,
කොළඹ. 08.
2006.10.09

සියළු ම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සමුපකාර ණය දෙන සමිතිවල
සභාපතිවරුන් වෙත,

මහත්මයාණෙනි,

## උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීම

සමුපකාර සමිතිවල සේවකයින් සමුපකාර ක්ෂේත්‍රයේ සහ අදාළ අනිකුත් අධ්‍යාපනික ක්ෂේත්‍රයන්හි උසස් මට්ටමේ සුදුසුකම් අත්පත් කර ගැනීම මගින් ඔවුනට මෙන්ම සමුපකාර සමිතිවලට ද කාර්ය ඵලදායි බව වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසේ.

02. ඒ අනුව එම සමිතිවල සේවයේ නිරත සේවකයින් විසින් අත්පත් කර ගනු ලබන උසස් අධ්‍යාපනික සුදුසුකම් වෙනුවෙන් පහත සඳහන් පරිදි දිරි දීමනා ගෙවීමට මෙම කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් ඔබුනට ඒ හා අදාළ ගෙවීම් කිරීමට ක්‍රියා කරන මෙන් කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

03. ඒ සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර, පහත සඳහන් විස්තර ද ඒ සමග ඉදිරිපත් කළ යුතුය.

i). ලබා ඇති අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සහතික පිටපත්
ii). මෙම සුදුසුකම් කාර්ය ඵලදායකත්වය කෙරෙහි දැනට හෝ ඉදිරියේදී බලපෑ හැකි අන්දම
iii). ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන තිබේද යන්න

04. කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මෙම වැටුප් වර්ධක හෝ/හා දීමනා ලබා දිය යුතු ආකාරය පහත දැක්වේ.

| ලබා ගත යුතු සුදුසුකම් | එක් වරක් පමණක් ගෙවන දීමනාව | වැටුප් වර්ධක ගණන |
|---|---|---|
| පශ්චාත් උපාධි සහතිකය | රු.2000.00 | 02 |
| වරලත් ගණකාධිකරණය හා ඒ හා සමාන වෙනත් විභාගවල අවසාන සහතිකය | රු.2000.00 | 02 |
| ගෞරව උපාධි සහතිකය | රු.1500.00 | 02 |
| සාමාන්‍ය උපාධි සහතිකය | රු.1000.00 | 01 |
| ඩිප්ලෝමා සහතිකය-සමු.සං.ආය.-පොල්ගොල්ල | රු.500.00 | 01 |
| සමුපකාර උසස් පෙළ (පූර්ණ සාමාර්ථය) | රු.500.00 | |
| සමුපකාර සාමාන්‍ය පෙළ (පූර්ණ සාමාර්ථය) | රු.500.00 | - |

05. යම්කිසි තනතුරකට බඳවා ගැනීමේදී මූලික සුදුසුකමක් ලෙස ඉහත කී සහතික පත් සලකා ඇත්නම් මෙම දීමනාව හිමි නොවේ.

06. දැනටමත් මෙවැනි දිරි දීමනා ලබා ගෙන ඇති සේවකයින්ට මෙම චක්‍රලේඛය අනුව නැවත එම දීමනා ලබා ගත නොහැකිය.

මෙයට - විශ්වාසී,

ජේ. ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර, පළාත් මාර්ග හා විදුලි බල අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ නිලධාරී
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, ගම්පහ, කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්